**පොල් වගාකිරීමේ මණ්ඩලය - 2014**
-----------------------------------------

පොල් වගාකිරීමේ මණ්ඩලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 43 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම
---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

--------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

---------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට පොල් වගාකිරීමේ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට මණ්ඩලයට අයත් තවාන්වල ඉතිරිව පැවති රු.123,683 ක පොහොර තොගය අවසන් තොග ගණනයේදී අත්හැරී තිබුණි.

(ආ) සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් තවදුරටත් මණ්ඩලයේ කටයුතු සඳහා යොදාගෙන තිබුණද එහි සාධාරණ අගය පෙන්නුම් කෙරෙන පරිදි ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2012 වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණු රු. 251,556 ක විගණන ගාස්තු අදාළ වෙන්කිරීමෙන් අඩු කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් විගණන ගාස්තු එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ලෙජරයට පිටපත් කිරීමේදී සිදුව තිබුණු ගිණුම්කරණ දෝෂ හේතුවෙන් දුරකථන වියදම රු. 684,460 ක් වැඩියෙන් හා ලිපි ද්‍රව්‍ය ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) මණ්ඩලයට අයත් ආදර්ශ පොල් උයන් 12 වෙනුවෙන් පවත්වාගෙන ගොස් තිබුණු ජංගම ගිණුම් මාසිකව සැසඳීමට කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට පොල් උයන් 05 ක හර ශේෂයන් 05 ක එකතුව රු. 18,261,799 ක් වූ අතර පොල් උයන් 07 ක බැර ශේෂයන් 07 ක එකතුව රු. 23,930,460 ක් විය. තවද තවාන් වෙනුවෙන් පවත්වාගෙන ගොස් තිබුණු ජංගම ගිණුමෙහි සමාලෝචිත වර්ෂයේ අවසානයට නොසැසඳුණු බැර ශේෂය රු. 1,116,656 ක් විය.

(ඊ) කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය ඉදිකිරීමට අදාළව නොනිමි වැඩ ගිණුම හා ණයහිමි ගිණුම රු. 319,213 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) තවාන් වල සේවකයන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා වූ පාරිතෝෂික වෙන් කිරීම් නිවැරදිව ගණනය කර තිබූ නමුත් රු.2,000,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඌ) ආදර්ශ පොල් උයන්වල දේපල පිරියත හා උපකරණ සඳහා ක්ෂය ගණනය කිරීමේ දී සමාලෝචිත වර්ෂයේ මිලදී ගත් වත්කම් හැර අනිකුත් වත්කම් ඒවා මිලදීගෙන තිබූ දිනයන් සැළකිල්ලට නොගෙන එක් එක් ආදර්ශ පොල් උයන වෙනුවෙන් ඉදිරියට ගෙන එන ලද දේපල පිරියත හා උපකරණ වටිනාකම වූ රු. 39,101,995 ක ආරම්භක ශේෂ මත ක්ෂය ගණනය කර තිබුණි.

(එ) මණ්ඩලය විසින් නිලධාරීන්ට හා සේවකයන්ට ලබා දී තිබූ ජංගම දුරකථන හා දුරකථන බිල්පත් ගෙවීම් වෙනුවෙන් වැඩිපුර අයකරගෙන තිබුණු රු.454,725 ක මුදලක් වගකීම් ලෙස දැක්වීම වෙනුවට දුරකථන ආදායම් ලෙස දක්වා තිබුණි.

**2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්**

**-------------------------------**

(අ) සමාලෝචිත වර්ෂයේදී දිවිනැගුම වැඩසටහන යටතේ නිකුත් කර තිබුණු මුළු පොල් පැළවල වටිනාකම රු.171,471,800 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල සංවර්ධන වැඩ සටහන් යටතේ දක්වා තිබුණු වටිනාකම රු.169,036,725 ක් වූයෙන් රු.2,435,075 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු බිල්පත් ඉදිරිපත් නොවීම හේතුවෙන් අම්පාර කප්තුරුපාය II අදියරට හා ත්‍රිකුණාමලය නිලධාරී නිල නිවස ඉදිකිරීමට අදාළව ගෙවිය යුතු මුදල් 2015 ජනවාරි හා පෙබරවාරි පැවති තත්ත්වයන් සැළකිල්ලට ගෙන ගිණුම්ගතකර තිබුණි.

**2.3 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු**

**--------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.8.2 ඡේදයට පටහැනිව මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් හා වතු කළමනාකරුවන් සඳහා කම්කරුවන් දෙදෙනෙකුගේ මාසික වේතනයට සමාන දීමනාවක් ද, සහකාර වතු කළමනාකරුවන් ප්‍රධාන කාර්යාලයේ සහකාර සාමාන්‍යාධිකාරිවරුන් හා වතු පාලන සේවාවේ කණිෂ්ඨ විධායක නිලධාරීන් සඳහා කම්කරුවෙකුගේ මාසික වේතනයට සමාන දීමනාවක් ද වශයෙන් 2011 නොවැම්බර් 01 දින සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුල රු. 16,710,389 ක් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව එම නිලධාරීන්ට ගෙවා තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. එමෙන්ම ආදර්ශ පොල් උයන්වල වතු කළමනාකරුවන් හා සහකාර වතු කළමනාකරුවන් මෙම දීමනාව ලබා ගන්නා අතරම ඔවුන්ගේ නිල නිවාසවල සේවය සඳහා එම ආදර්ශ පොල් උයන්වල චෙක් රෝල් කම්කරුවන් දෙදෙනෙකු යොදවා ගෙන තිබූ බවද විගණනයේ දී නිරීක්ෂණය විය.

(ආ) වැලිගම පොල් කොළ මැලවීමේ හා කුණුවීමේ රෝග මර්දන වැඩසටහන යටතේ දක්ෂිණ ලංකා පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය සංවර්ධනය සඳහා පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය විසින් ලබා දී තිබුණු රු. මිලියන 5 ක මුදලින් රු. 620,000 ක් වැයකර අදාල අරමුණට පටහැනිව මුද්දර මිලදී ගෙන රේඛීය අමාත්‍යාංශය වෙත භාරදී තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**------------------**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

**-------------**

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.34,890,412 ක අතිරික්තයක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 71,772,762 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 36,882,350 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මුළු ආදායම රු. මිලියන 82 කින් වැඩි වීමට වඩා සංවර්ධන වැඩසටහන් වියදම් හා මෙහෙයුම් වියදම් රු. මිලියන 118 කින් වැඩි වීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ආදර්ශ පොල් උයන්වල මෙහෙයුම් ප්‍රතිඵලය රු.99,791,389 ක ශුද්ධ ලාභයක් වූ අතර, ඒ හා සසඳන විට ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු. 71,337,032 ක් වූයෙන් ලාභය රු. 28,454,357 කින් වැඩි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී තවාන් ඒකකය රු. 32,826,653 ක ශුද්ධ ලාභයක් ලබා තිබූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලබා තිබුණු ශුද්ධ ලාභය රු. 91,244,893 ක් විය.

## 3.3 මණ්ඩලයට එරෙහිව හෝ මණ්ඩලය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

බාහිර පුද්ගලයන් 10 දෙනෙකු විසින් එකතුව රු. 11,000,000 ක වන්දි ඉල්ලා මණ්ඩලයට එරෙහිව අධිකරණවල නඩු 08 ක් පවරා තිබූ අතර මණ්ඩලය විසින් බාහිර ආයතන හා පුද්ගලයන් 03 දෙනෙකුට එරෙහිව එකතුව රු. 2,174,915 ක වන්දි ඉල්ලා අධිකරණවල නඩු 03 ක් පවරා තිබුණි.

# 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 සහනාධාර ගෙවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දී ක්‍රියාත්මක කර තිබූ සහනාධාර වැඩ සටහන් සම්බන්ධයෙන් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන හා සැලසුම් අංශය විසින් සපයන ලද මූල්‍ය තොරතුරු අතර සමානතාවයක් නොවූ අතර එහි වෙනස රු. 4,274,348 ක් විය.

(ආ) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී සහනාධාර වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කර තිබූ අතර, වර්ෂය අවසානයේදී සහනාධාර වැඩසටහන්වල භෞතික ඉලක්කය හා ප්‍රගතිය පහත පරිදි විය.

(i) කප්රුකයි පරපුරයි සහනාධාර වැඩසටහන යටතේ පොල් පැළ 160,000 ක් බෙදා දීමට ඉලක්ක කර තිබුණද බෙදාහැර තිබුණු ප්‍රමාණය පොල් පැළ 119,717 ක් පමණක් විය. ඒ අනුව සමස්ත කාර්යසාධනය සියයට 75 ක් වූවද ප්‍රාදේශීය කාර්යාල මට්ටමෙන් පරීක්ෂා කිරීමේදී ප්‍රාදේශීය කාර්යාල 6 ක කාර්යසාධනය සියයට 50 කට අඩු මට්ටමක පැවතුණි.

(ii) කප්රුක පුරවර වැඩසටහන යටතේ පොල් පැළ 1,802,610 ක් බෙදා දීමට ඉලක්ක කර තිබූ අතර බෙදා දී තිබුණු ප්‍රමාණය පොල් පැළ 1,785,356 ක් පමණක් විය. ඒ අනුව කාර්යසාධනය සියයට 99 ක් විය. කෙසේ වුවද ප්‍රාදේශීය කාර්යාල මට්ටමෙන් පරීක්ෂා කිරීමේදී ත්‍රිකුණාමලය ප්‍රාදේශීය කාර්යාලයේ කාර්යසාධනය සියයට 23 ක අවම මට්ටමක පැවතුණි.

(iii) පොල් ඉඩම් පුනරුත්ථාපන වැඩසටහන යටතේ පොල් පැළ 350,010 ක් බෙදා දීමට ඉලක්ක කර තිබූ අතර ඒ සඳහා පොල් පැළ 392,156 ක් බෙදා දී තිබුණි. ඒ අනුව කාර්යසාධනය සියයට 112 ක් විය. කෙසේ වුවද ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් පරීක්ෂා කිරීමේදී පොළොන්නරුව හා යාපනය ප්‍රාදේශීය කාර්යාලයන් හි කාර්යසාධනය පිළිවෙලින් සියයට 35 ක් හා සියයට 49 ක අවම මට්ටමක පැවතුණි.

සමාලෝචිත වර්ෂයේදී පොල් ඉඩම් පුනරුත්ථාපන සහනාධාරය යටතේ පාළු සිටුවීම සඳහා පොල් පැළ බෙදා දීම පමණක් සිදුකර තිබුණු අතර, පාංශුඛාදනය අඩුකිරීම හා තෙතමන සංරක්ෂණය කිරීම සඳහා සහනාධාර කිසිවක් ලබාදී නොතිබුණි.

(iv) පූජා භූමිවල පොල් වගා කිරීමේ සහනාධාර වැඩසටහන යටතේ පොල් පැළ 2,500 ක් බෙදා දීමට ඉලක්ක කර තිබූ අතර ඒ වෙනුවෙන් පොල් පැළ 8,755 ක් බෙදා දී තිබුණි. ඒ අනුව කාර්යසාධනය සියයට 350 ක් වී තිබුණි. කෙසේ වුවද ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් පරීක්ෂා කිරීමේදී කුලියාපිටිය ප්‍රාදේශීය කාර්යාලයේ කාර්යසාධනය සියයට 40 ක අවම මට්ටමක පැවතුණි.

**4.1.2 ආදර්ශ පොල් උයන්**

---------------------

සමාලෝචිත වර්ෂයේදී ආදර්ශ පොල් උයන් ලෙස වතු 12 ක් මණ්ඩලය විසින් කළමනාකරණය කර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සාමාන්‍ය තත්ත්වයන් යටතේ පොල් වගාබිම් අක්කරයකින් වාර්ෂිකව අවම වශයෙන් පොල් ගෙඩි 4,500 - 5,000 ත් අතර ප්‍රමාණයකින් පොල් ඵලදාවක් ලබා ගත හැකි වුවත් සමස්තයක් ලෙස මණ්ඩලය සතු ආදර්ශ පොල් උයන් වලින් මහයාය, පාසිකුඩා හා මුන්දලම හැර අනෙකුත් සියළුම ආදර්ශ උයන්වල ඵලදාව සාමාන්‍ය මට්ටමවත් ලඟා කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ආ) ආදර්ශ පොල් උයන් 05 ක වැටුණු පොල් ප්‍රතිශතය සියයට 30 ත් සියයට 56 ත් අතර පරාසයක විය.

**4.1.3 වතු කළමනාකරණය**

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වතුවල ප්‍රගතිය විමර්ශනය සඳහා වූ ජාලගත තොරතුරු පද්ධතියට දත්ත ඇතුළත් කිරීම, වතු කළමනාකරුගේ මුර පදය භාවිතා කරමින් ඔහු හෝ යටත් නිලධාරින් විසින් සිදු කර තිබුණු අතර, ජාලයට ප්‍රවේශ වීම සටහන් කිරීමේ ලේඛනයක් පවත්වා නොතිබීම හා දත්ත ඇතුළත් කරන ලද්දේ කවුරුන්ද යන්න හඳුනාගැනීමේ තොරතුරු නොතිබීම හේතුවෙන් එම දත්තවල විශ්වාසදායී බව හා එහි වගකීම සම්බන්ධයෙන් අවිනිශ්චිත තත්ත්වයක් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා පොල් ඵලදාව හා ඵල දරන පොල් ගස් සම්බන්ධයෙන් වතුවල ප්‍රගතිය විමර්ශනය කිරීම සඳහා වූ ජාලගත තොරතුරු පද්ධතිය මඟින් සැපයෙන තොරතුරු හා ඒ සම්බන්ධයෙන් හස්ත (මැනුවල්) ක්‍රමය මඟින් සැපයෙන තොරතුරු අතර සමානතාවයක් නොවීය. මෙසේ සංගතතාවක් නොවීමෙන් පොල් වතු අංශයේ දෛනික, සතිපතා, මාසික හා වාර්ෂික ප්‍රගතිය විධිමත් තොරතුරු පද්ධතියක් මඟින් සමාලෝචනය කර ගැනීමේ අරමුණ ලඟා කර ගැනීමේ ගැටළුවක් ඇතිවිය හැකිව තිබුණි.

(ඇ) මණ්ඩලය සතු ආදර්ශ පොල් උයන් 12 ට අදාලව පොල් වගාව සඳහා ඉඩම් යෝග්‍යතා වර්ගීකරණයක් සිදු කර නොතිබුණු අතර, මේ නිසා උපරිම ඵලදාවක් ලබාගැනීමට අනුගමනය කළ යුතු වන උපක්‍රමයන් නිවැරදිව හඳුනාගැනීමේ ගැටළු ද, පොල් ඵලදාව නිවැරදිව ඇස්තමේන්තු කිරීමට මගපෙන්වීමක් ලබාගැනීමටද නොහැකි වී තිබුණි.

(ඇ) පොල් මයිටා මර්දනය කිරීමේ අන්තර් නිර්දේශයන් හැරුණුවිට තිරසාර ජෛව විද්‍යාත්මක ක්‍රමයක් ලෙස විලෝපිත මයිටාව පොල් පර්යේෂණ මණ්ඩලය විසින් හඳුන්වා දී තිබූ අතර, සමාලෝචිත වර්ෂයේදී පොල් වගා කිරීමේ මණ්ඩලය විලෝපිත මයිටා විද්‍යාගාර 07 ක්

පවත්වාගෙන ගොස් තිබුණි. කෙසේ වුවද මණ්ඩලය පවත්වාගෙන යන ආදර්ශ පොල් උයන් 12 හි කලටි/කුරුවල්/කුඩා ගෙඩි ප්‍රමාණයන් ඉහළ යාමට මයිටා හානිය බෙහෙවින් බලපා තිබුණි.

**4.1.4 විලෝපිත මයිටා නිෂ්පාදනය හා බෙදා හැරීම**

**-----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට පෙර ආරම්භකර තිබූ මයිටා විද්‍යාගාර 6 ට අදාලව විලෝපිත මයිටා පැකට් නිෂ්පාදනය හා බෙදාහැරීම පිළිබඳ ඉලක්කයන් කිසිවක් ක්‍රියාකාරී සැලැසුමෙහි අන්තර්ගත වී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මුලතිව් හා වාරියපොල යන විලෝපිත මයිටා විද්‍යාගාර දෙකෙහි විලෝපිත මයිටා පැකට් බෙදාහැරීමේ කාර්යසාධනය එහි නිෂ්පාදනයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 43 ක හා සියයට 52 ක අවම මට්ටමක පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ක්රියාත්මක වූ විලෝපිත මයිටා විද්‍යාගාර 7න් විද්‍යාගාර 5 ක් සිය නිෂ්පාදන ධාරිතා මට්ටමින් හරි අඩක්වත් ලඟා කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පාරිතෝෂික ගණනය කිරීම් සඳහා මානව සම්පත් කළමනාකරණ අංශය ලබා දී තිබුණු පත්වීම් දිනයන් හා ගිණුම් අංශය විසින් ගණනය සඳහා යොදාගෙන තිබුණු පත්වීම් දිනයන් අතර වෙනස්කම් නිරීක්ෂණය වුයෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට ප්‍රධාන කාර්යාලය සඳහා පාරිතෝෂික වෙන්කිරීම් වශයෙන් දැක්වෙන රු.156,617,588 හි නිවැරදිතාවය පිළිබඳව විගණනයේදී සෑහිමකට පත්විය නොහැකි විය.

(ආ) 2005 වර්ෂයේදී ජීප් රථයක් අලුත්වැඩියා කිරීම සඳහා සංස්ථාවකට අත්තිකාරම් වශයෙන් රු. 149,640 ක් ලබා දී තිබුණි. එම මුදලින් රු.89,550 ක අළුත්වැඩියා අවසන් කර ඇතත්, ඉතිරි මුදල වන රු. 60,090 ක් ආපසු අය කර ගැනීමකින් තොරව අත්තිකාරම් ගිණුමේ තවදුරටත් පෙන්වා තිබුණි.

(ඇ) 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා මයුරපුර තවාන පවත්වාගෙන යාම සඳහා මණ්ඩලය රු. 3,937,932 ක වියදමක් දරා තිබුණි. නමුත් ශක්‍යතා අධ්‍යනයක් සිදුකර නොතිබීම නිසා ඉහත වියදමේ ඇතුළත් රු. 564,305 ක් වැයකර බීජ පොල් තවාන් කර තිබුණත් එය අසාර්ථක වී තිබුණි. මෙම තවානෙහි මුරකරුවන් දෙදෙනෙකු වෙනුවෙන් 2011 වර්ෂයේ සිට 2015 සැප්තැම්බර් 30 දක්වාත් මාසිකව රු. 34,000 කට ආසන්න වැටුපක් ගෙවීම් කරනු ලබයි.

**4.3 ආර්ථික නොවූ ගණුදෙනු**

**----------------------**

මොණරාගල දිස්ත්‍රික්කය තුල ද වැලිගම පොල් කොළ මැලවීමේ හා කුණු වීමේ රෝගය පැවතීමේ අවදානම නිරීක්ෂණය කිරීමේ සම්බන්ධීකරණ කටයුතු සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු 2013 නොවැම්බර් 11 වන දින සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස දක්වා රියදුරු සමඟ වාහනයක් සහිතව මොණරාගල ප්‍රාදේශීය කාර්යාලයට අනුයුක්ත කර රු. 810,828 ක වියදමක් කර තිබුණි. ඔහු විසින් මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ කටයුතු පිළිබඳ

වාර්තා වැලිගම රෝග කමිටුව විසින් සමාලෝචනය කර තිබුණු බවට සාක්ෂි නොවූ අතර එම වාර්තා රෝගය මැඩලීම සම්බන්ධයෙන් කෙසේ යොදා ගත යුතුද යන්න ගැටළු සහගත විය.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

-----------------------------

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව 925 ක් වූ අතර ස්ථිර හා කොන්ත්‍රාත් වශයෙන් තථ්‍ය සේවක සංඛ්‍යාව 687 ක් විය. මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා අදාළ වන අනුමත තෘතීයික මට්ටමේ හා ද්විතීයික මට්ටමේ තනතුරු පිළිවෙලින් 3 ක් හා 208 ක්ද ප්‍රාථමික මට්ටමේ තනතුරු 27 ක් ද පුරප්පාඩුව පැවතුණි.

## 5. පද්ධති හා පාලනයන්

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) මානව සම්පත් කළමනාකරණය
(ආ) තවාන් කළමනාකරණය
(ඇ) වතු කළමනාකරණය
(ඈ) සහනාධාර ගෙවීම්